## 125 – පෙමින් පිදුන ඔබේ දිවිය

පෙමින් පිදුන ඔබේ දිවිය කුරුසෙ මත එදා
ලෙයින් ඔබේ  දෙව්නි අපේ පාපි බව සදා
අතින් අපේ පිදෙන පඬුරු සමග දුක් කඳා
බැතින් බරවූ පුදමු ඔබට ආදරින් මෙදා

මෙන්න අපේ තිලිණ ඔබට අප මෙදා
රැගෙන දෙන්න සුහඳ සමිඳ ඔබේ පෙම් දයා
ඔබේ පෙම් දයා

දුකින යදින පුදන පව්වූ දුගී දනා මෙදා
නැමුන දණින් පුදා පූජේ පව් කමා යැදා
පිදෙන ඔබට මිදි රස හා සියලු දුක බෙදා
මෙන්න ගන්න රජිඳ අපේ ආදරින් මෙදා

දිළිඳු අපට නොමැත වුවත් මැනික් පුදනටා
දිළිඳු බවත් ආදරයත් වෙනෙ අපහටා
කිතුඳු ඔබයි දිවි දුන්නේ පාපි සතහටා
දිළිඳු සැමෝ ආදරයෙන් පිදෙයි ඔබහටා